අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2016.12.02 දින අනුමත කොට ඇති බව
සහතික කරමි. පිටු 02 කි.

2016.12.05

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

**සංශෝධන අංක 01**

| දැනට අනුමත වී ඇති ආකාරය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|
| 9.2.2.5<br><br>III. පූර්වාසන්න වසර 05 ක කාලයක් තුල දකුණු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. | <br><br>ඉවත් කරනු ලැබේ. |
| V. - | V. සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව එම එක් එක් දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණන වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරඟ කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි. |
| VI. - | VI. දිස්ත්‍රික්කයට අයත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම්:<br>විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කල යුතු අවසන් දිනට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (03) වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටිය අයෙකු විය යුතුය. |
| 9.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. | : ලිඛිත විභාගයක් පවත්වා එහි ප්‍රතිඵල මත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වා පවතින පුරප්පාඩු ප්‍රමාණය මත බඳවා ගනු ලැබේ. |
| 9.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ. | අදාළ වේ. |
| 9.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : | ඉවත් කරනු ලැබේ. |
| 9.2.4.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා:<br>පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් | ඉවත් කරනු ලැබේ. |
| 9.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ. | අදාළ වේ. |

**ඇමුණුම 04**

විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40% |
| අභියෝග්‍යතාවය | පැය 01 | 100 | 40% |
| ව්‍යාපෘති සැලසුම්කරණය | පැය 01 | 100 | 40% |

විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනුම | ජාතික හා ජාත්‍යන්තර සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අංශ පිළිබඳ දැනුම |
| අභියෝග්‍යතාවය | සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්න |
| ව්‍යාපෘති සැළසුම්කරණය | ව්‍යාපෘතියක් යන්න නිර්වචනය කිරීම, ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යාපෘති චක්‍රය, ව්‍යාපෘති පිළියෙල කිරීම හා විග්‍රහ කිරීම, ව්‍යාපෘති ඇගයුම, ව්‍යාපෘති සංවිධානය, ණයා මිළ යොදා ගැනීම |

05. විභාගය පවත්වන බලධාරියා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

06. අයදුම්පත් කැඳවන ක්‍රමය : ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම මගින්

දකුණු පළාත් සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ උක්ත වගන්ති සංශෝධනය කිරීම නිර්දේශ කරමි.

2016.11.30

අත්සන : .................................

නම : ඩී. ජී. විදුර කාරියවසම්.

ලේකම්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දකුණු පළාත.

නිල මුද්‍රාව :

ඩී.ජී. විදුර කාරියවසම්

ලේකම්

... සේවා කොමිෂන් සභාව

දකුණු පළාත

අනුමත අංකය 246

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා

විසින් 2016.12.02 දින අනුමත කොට ඇති බව

සහතික කරමු. පිටු 02 කි.

2016.12.05

ආණ්ඩුකාර ලේකම්

දකුණු පළාත